**ඉරක්කාමම් ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**------------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-----------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 අප්‍රේල් 05 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 19 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ඉරක්කාමම් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**-----------------------------------------**

**1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**
**-----------------------**

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා භාවිතා කරනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**
**--------------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් රු.මිලියන 10 ක පිරිවැයකින් ඉදිකර 2011 වර්ෂයේදී සභාවට භාරදී තිබූ කාර්යාල ගොඩනැගිල්ලේ වටිනාකම ගිණුම්වලට ඇතුළත් නොකිරීමෙන් සමුච්චිත අරමුදල සහ ස්ථාවර වත්කම් එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) නගර සැලසුම් සහ ජල සම්පාදන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ ළමා උද්‍යානයේ සවිකරන ලද වර්ග 28 කට අයත් අයිතමයන් 29 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ ගෙවනු ලැබූ රු.1,034,605 ක් ස්ථාවර වත්කම් ලෙස නොදැක්වීම හේතුවෙන් සමුච්චිත අරමුදල් හා ස්ථාවර වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

**1.3.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**
**--------------------------------------**

සභාව විසින් ඉදිරිපත් කරනු ලැබූ 2017 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම රු.3,476,675 ක් සහ ලැබිය යුතු මස් කඩ බදු කුලී වටිනාකම රු.1,029,223 පිළිබඳ විස්තරාත්මක ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 1.3.3 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීතියේ I පරිච්ඡේදයේ 5 (XII) වගන්තිය | - | මුදල්, ගබඩා භාණ්ඩ සහ චෙක්පත්වල අත්සන් තැබීම ආදිය නිලධාරීන් තිදෙනෙකුට පරිපාලනමය වශයෙන් පවරා දී තිබුණත්, ඔවුන්ගෙන් ආරක්ෂිත ඇප ලබාගෙන නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 265,993 | වර්ෂ 02 ක් ඉක්ම වූ ඉකුත් තැන්පතු 02 ක් සම්බන්ධයෙන් සභාව අදාළ පුද්ගලයින්ට ආපසු ලබාදීමට හෝ ආදායම් ගිණුම්වලට මාරු කිරීමට හෝ කටයුතු කර නොතිබුණි |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,174,034 ක් විය. එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,637,187 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,536,847 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 ආදායම් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම් හා හිඟ ආදායම

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට ආදාලව ඉදිරිපත් කර තිබු ඇස්තමේන්තුගත ආදායම, බිල් කළ ආදායම, රැස් කළ ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2017 ඇස්තමේන්තුගත ආදායම් | 2017 බිල්කළ ආදායම් | 2017 රැස්කළ ආදායම් | 2017 දෙසැම්බර් 31 දිනට හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම් | 2016 බිල් කළ ආදායම් | 2016 රැස්කළ ආදායම් | 2016 දෙසැම්බර් 31 දිනට හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| (i) | වරිපනම් හා බදු | 30 | 44 | 44 | - | 65 | 26 | 26 | - |
| (ii) | කුලී | 4,075 | 3,787 | 3,684 | 1,132 | 4,600 | 5,191 | 5,191 | 1,029 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| (iii) | බලපත්‍ර ගාස්තු | 670 | 673 | 673 | - | 480 | 670 | 670 | - |
| (iv) | අනෙකුත් ආදායම් | 2,258 | 1,991 | 1,991 | - | 1,433 | 1,768 | 1,768 | - |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

2017 දෙසැම්බර් 31 දින දක්වා සභාව විසින් අයකරගත යුතු ආදායම රු.7,523,240 ක වටිනාකමෙන් සමාලෝචිත වර්ෂයේදී රු.6,391,417 ක් අයකරගෙන තිබුණි. මේ අනුව ආදායම් රැස්කිරීමේ ප්‍රතිශතය 85% ක් වශයෙන් දැක්වුණි.

**2.2.3 වරිපනම් හා බදු**

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි ව්‍යාපාරික ස්ථාන 305 ක් සහ නිවාස 4,673 ක් මත 2010 වර්ෂයේ සිට වරිපනම් ගාස්තු තක්සේරු කර අයකර ගැනීමට කටයුතු කර නොතිබීමෙන් වාර්ෂිකව ආසන්න වශයෙන් රු.2,500,000 ක ආදායමක් අහිමි වෙමින් පැවතුණි.

**2.2.4 කුලී ආදායම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ JCB කුලියට දීමෙන් ලැබිය යුතු කුලී ආදායම් රු.31,600 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ආ) 2003 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ හිඟ හිටව පැවති මස් කඩ බදු මුදල් රු.1,029,223 ක් මේ දක්වා අයකර ගෙන නොතිබුණි.

**2.2.5 ප්‍රචාරණ දැන්වීම් පුවරු සඳහා ගාස්තු අයකිරීම**

ප්‍රචාරණ දැන්වීම් පුවරු සඳහා 2014, 2015 සහ 2016 වර්ෂ සඳහා බලපත්‍ර ගාස්තු රු.216,440ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

පළාත් සභාවට වෙන්කරනු ලැබූ සංවර්ධන සහනාධාර යටතේ 2016 වර්ෂයේ රු.997,147 ක පිරිවැයකින් ඉදිකරනු ලැබූ ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයට අවශ්‍ය යන්ත්‍රෝපකරණ සවි නොකිරීම හේතුවෙන් මේ දක්වා එය භාවිතයට ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

(ආ) **පාරිසරික ගැටළු**

පළාත් සභාවට වෙන්කරනු ලැබූ සංවර්ධන සහනාධාර යටතේ 2015 වර්ෂයේදී රු.1,338,328 ක පිරිවැයකින් ඉදිකරනු ලැබූ සත්ව ඝාතකාගාරය සුසාන භූමියට ආසන්නයේ ඉදිකර තිබූ බැවින් මහජනතාවගේ විරෝධය හේතුවෙන් මේ දක්වා ප්‍රයෝජනයට ගත නොහැකිව තිබුණි.

(ඇ) **තිරසාර සංවර්ධන අරමුණු**

2017 වර්ෂයේ අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත 2030 වර්ෂය සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන වැඩසටහනට අනුකූලව සෑම ආයතනයක්ම ක්‍රියාකළ යුතුය. එසේ වුවත්, මේ සම්බන්ධයෙන් ඉලක්කයන් හඳුනාගෙන එය සාක්ෂාත් කර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කාර්යාල ගොඩනැගිල්ල, මහජන පුස්තකාලය, පොදු වෙළඳපොළ, මහජන ක්‍රීඩාංගනය සහ ගව ඝාතකාගාරය යනාදිය පිහිටි ඉඩම් 06 ක අයිතිය සභාවේ නමට මාරුකිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සභාවේ වාහන සඳහා වාහන බලපත්‍ර ගාස්තු නියමිත කාලපරිච්ඡේදයේ ලබාගැනීමට අපොහොසත් වීමෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට දඩ ගාස්තු ලෙස රු.3,815 ක් ගෙවීම් කර තිබුණි.

(ඇ) 2010 වර්ෂයේ නව කාර්යාල ගොඩසැගිල්ල ඉදිකිරීම සඳහා සම්පූර්ණයෙන් කඩා ඉවත් කළ පැරණි ගොඩනැගිල්ලේ පිරිවැය රු.4,122,181ක් සභාවේ කළමනාකරණ කමිටු තීරණය නොමැතිව ගිණුම්වලින් ඉවත් කර තිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවැති සභාවේ ආදායම් පරීක්ෂක තනතුර සඳහා බඳවාගැනීම් සිදු නොකළ නිසා ආදායම් මාර්ග හඳුනාගැනීම් සහ ආදායම් අයකිරීම් ආදී ක්‍රියාවලීන් නිසි අයුරින් ක්‍රියාත්මක නොකර පැවතුණි.

(ආ) 2015 සැප්තැම්බර් 01 දින ප්‍රාදේශීය පළාත් පාලන සහකාර ආණ්ඩුකාර කාර්යාලයට සභාවෙන් තාවකාලිකව මුදාහරිනු ලැබූ සෞඛ්‍ය කම්කරු මේ දක්වා සභාවට ආපසු නිදහස් නොකිරීමෙන්, කසළ ඉවත් කිරීම හා සෞඛ්‍ය කාර්යයන් සඳහා සේවක පුරප්පාඩු පැවතුණි.

**4.** **පද්ධති හා පාලන**

**------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| | **පාලන ක්ෂේත්‍රය** | **විශේෂ අවධානය යොමුකළ යුතු කරුණු** |
|---|---|---|
| | **---------------------** | **---------------------------------------** |
| (අ) | ගිණුම් තැබීම | ගිණුම් යාවත්කාලීනව හා නිසි අයුරින් පවත්වා ගැනීම. |
| (ආ) | ස්ථාවර වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගැනීම. |
| (ඇ) | ආදායම් අයකිරීම කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |
| (ඈ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | කසල වෙන්කර එකතු කිරීම |